# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත

---

**[සහතිකය සටහන් කලේ 2003 නොවැම්බර් මස 11 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2003 නොවැම්බර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 8.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි

# 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත

[සහතිකය සටහන් කළේ 2003 නොවැම්බර් මස 11 වන දින]

එල්. ඩී.–ඕ. 29/2003.

**ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පිළිවෙලින් 1964 ඔක්තෝබර් මස 30 වන දින සහ 1974 ජනවාරි මස 27 වන දින ඉන්දු ලංකා ගිවිසුම යනුවෙන් සඳහන් කරනු ලබන, ශ්‍රී ලංකාවේ සිටින ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ගේ තත්ත්වයට සහ ඔවුන්ගේ අනාගතයට අදාළව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ඉන්දියාවේ ආණ්ඩුව අතර (1964 අංක 5 දරන සම්මුති කාණ්ඩ ලෙස පළ කරනු ලැබූ) ලිපි හුවමාරුවක් 1964 ඔක්තෝබර් මස 30 වන දින නවදිල්ලියේ දී සිදු වූ හෙයින් ද, ශ්‍රී ලංකාවේ සිටින ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ගේ තත්ත්වයට සහ ඔවුන්ගේ අනාගතයට අදාළව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ඉන්දියාවේ ආණ්ඩුව අතර (1974 අංක 1 දරන සම්මුති කාණ්ඩය ලෙස පළ කරනු ලැබූ) ලිපි හුවමාරුවක් 1974 ජනවාරි මස 27 වන දින නවදිල්ලියේ දී සිදු වූ හෙයින් ද :

තවද, එකී ගිවිසුමේ දින සිට අවුරුදු පහළොවක කාලයක් ඇතුළත පුරවැසිභාවයක් නොමැතිවීමේ ප්‍රශ්නය විසඳීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ ඉන්දියාවේ ආණ්ඩුව එකඟ වූ හෙයින් ද :

තවද, ඇතැම් අනපේක්ෂිත අවස්ථානුගත කරුණු හේතු කොට ගෙන ඉහත කී ගිවිසුම ප්‍රකාරව භාරගනු ලැබූ වගකීම් ඉටු කරනු නොලැබූ හෙයින් ද 1986 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත සහ 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඉන්දියානු සම්භවයක් ඇති තැනැත්තන් 5,06,000 කින් ඇතැම් අයට ඉන්දියානු පුරවැසිභාවය ප්‍රදානය කරනු නොලැබූ අතර ඇතැම් අයට ඉන්දියානු පුරවැසිභාවය ප්‍රදානය කරනු ලැබූ නමුත් දිගටම ශ්‍රී ලංකාවෙහි පදිංචිව සිටින හෙයින් ද :

ඉන්දියානු සම්භවයක් ඇති තැනැත්තන්ගේ පුරවැසිභාවය පිළිබඳ ප්‍රශ්නය විසඳීම ජාතික යහපත උදෙසා වන හෙයින් ද :

එම නිසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2-H 019278- 4,500 (2003/09)

ඇතැම් තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කිරීම.

**2**. මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ දී-

(අ) 1964 ඔක්තෝබර් මස 30 වන දින සිට ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවකු වශයෙන් සිට ඇති ; හෝ

(ආ) 1964 ඔක්තෝබර් මස 30 වන දින සිට ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවකු වශයෙන් සිට ඇති තැනැත්තකුගෙන් පැවත එන්නා වූ ද, දැනට ශ්‍රී ලංකාවේ පදිංචිකරුවකු වූ ද,

ඉන්දියානු සම්භවයක් සහිත යම් තැනැත්තකුට, එම දිනයේ සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කරනු ලැබිය යුතු අතර, නීතිය මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියකුට හිමිකම් ඇත්තේ යම් අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට ද, එම සියලුම අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට ඒ ආකාරයට ම සහ ඒ ප්‍රමාණයට ම ඒ තැනැත්තාට ද හිමිකම් තිබිය යුතු ය :

එසේ වුවද, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ඉන්දියානු ගමන් බලපත්‍රයක් හෝ වෙනත් සමාන ලේඛනයක් දරන ස්ථිර පදිංචිකරුවකුට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කිරීම, ඔහු විසින්, ඔහුගේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ස්වේච්ඡාවෙන්ම අත්කර ගැනීමට ඔහුගේ ඇති චේතනාව සඳහන් කරමින්, උපලේඛනයෙහි දක්වා ඇති විශේෂ ප්‍රකාශන ආකෘතියෙහි වූ ප්‍රකාශයක් ඔහු විසින් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීමේ දී සහ එම ප්‍රකාශය කොමසාරිස්වරයා විසින් ලිඛිතව පිළිගනු ලැබීමේ දී පමණක් බලාත්මක විය යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අත්කර ගැනීමේ දී අයිතිවාසිකම් සහ වගකීම්.

**3**. 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අත්කර ගන්නා සෑම තැනැත්තෙක්ම —

(අ) නීතිය මගින් පිළිගනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට හිමිකම් ලැබීමට අමතරව, ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකුට අදාළ වන ආකාරයට ම සහ එම ප්‍රමාණයට ම, පුරවැසිභාවය අහිමිවීමට සහ නැතිවීමට අදාළ සහ පුරවැසිභාවය අත්හැරීමට අදාළ විධිවිධානවලට ද යටත් විය යුතු ය ; තවද,

(ආ) මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට සහ එදිනට පසුව යම් තැනැත්තකු හෝ අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ දෙමව්පියන්, මුතුන්මිත්තකු හෝ ස්වාමිපුරුෂයකු, ඒ

තැනැත්තාගේ සම්භවයක් ඇති රටේ බලාත්මකව පැවති යම් නීතියක් යටතේ ඒ තැනැත්තාට හිමිකම් ඇති හෝ හිමිකම් තිබිය හැකි වූ සියලු සිවිල් හෝ දේශපාලන තත්ත්වයන් පිළිබඳ සියලු අයිතිවාසිකම් අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය ; තවද,

(ඇ) ශ්‍රී ලංකාවෙහි ඒ තැනැත්තාගේ තත්ත්වය, පෞද්ගලික අයිතිවාසිකම්, කාර්ය භාරයන් සහ දේපළ දැරීමට අදාළ සියලු කරුණුවල දී ශ්‍රී ලංකාවෙහි අදාළ නීතියට යටත් විය යුතු ය.

පුරවැසිභාවය පිළිබඳ සහතිකය සඳහා ඉල්ලුම් කිරීම.

4. (1) 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් තැනැත්තකු, තමා කැමති නම් මේ පනතේ “අ” උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රයට සාරානුකූලව වූ ආකෘති පත්‍රයක්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් ලබා ගැනීම සඳහා කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කළ හැකි ය. සෑම ඉල්ලුම්පත්‍රයක්ම, එම උපලේඛනයේම දක්වා ඇති දිවුරුම් යටතේ කරන ලද සාමාන්‍ය ප්‍රකාශයක් සමග ඉදිරිපත් කළ යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් තමා වෙත ලැබීමේ දින සිට දින හැටක් ඇතුළත, මේ පනතේ “ආ” උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ සහතිකයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) කොමසාරිස්වරයා විසින් මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුත්තේ 1967 අංක 14 දරන ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත යටතේ සහ 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහතිකයක් නිකුත් කරනු නොලැබූ තැනැත්තන්ට පමණකි.

(4) නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් මිස, (1) වන උපවගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලැබූ සහතිකයක් කවර හෝ කාර්යයක් සඳහා ඉදිරිපත් කරන ලෙස, කිසිම තැනැත්තකුට නියම කරනු නොලැබිය යුතු අතර එම කරුණ ඔප්පු කිරීමෙහි ලා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය. තව ද, එම දිවුරුම් ප්‍රකාශය, එම කරුණ සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් ලෙස පිළිගනු ලැබිය යුතු ය.

පනත වෙනත් නීති අභිබවා බලපැවැත්විය යුතු බව.

5. ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළව වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, එම නීතිය අභිබවා මේ පනත බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**6**. මේ පනතෙහි "කොමසාරිස්වරයා" යන්නෙන්, 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත යටතේ පත් කරනු ලැබූ, ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා වූ කොමසාරිස්වරයා අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

'අ' උපලේඛනය

(2 වන සහ 4 වන වගන්ති)

**2003 අංක 35 දරන ඉන්දීය සම්භවයක් ඇති පුද්ගලයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත**

පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරු වන*/ බාලවයස්කාර ළමයකු වන ........................... ගේ දෙමාපියකු වන*/ මාගේ*/ ඉහත නම් සඳහන් මාගේ ළමයාගේ* පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉහත කී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් ඉල්ලුම් කරනු ලැබේ.

2 ඉහත කී පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, මම*/ඉහත නම් සඳහන් මාගේ ළමයා *ශ්‍රී ලංකාවේ පුරවැසියකු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

3. මට*/ මාගේ ළමයාට* අදාළ විස්තර මා විසින් පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කරමි.

(අ) සම්පූර්ණ නම :

(ආ) ලිපිනය :

(ඇ) ස්ත්‍රී පුරුෂ භාවය : පුරුෂ/ස්ත්‍රී

(ඈ) උපන් දිනය :

(ඉ) උපන් ස්ථානය :

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටත දී උපන්නේ නම් උපත ලියාපදිංචි කළ ස්ථානය :

(උ) දෙමාපියන්ගේ විස්තර :

| පියා | මව |
|---|---|
| නම : | නම : |

| | |
|---|---|
| ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන වග : | ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන වග : |
| ජා. හැ. ප. අංකය (ඇත්නම්) : | ජා.හැ.ප. අංකය (ඇත්නම්) : |
| පදිංචි ලිපිනය : | පදිංචි ලිපිනය : |

### පොදු ප්‍රකාශන පත්‍රය

4. මම*/ඉහත නම සඳහන් මාගේ ළමයා ශ්‍රී ලංකාවේ පදිංචිකරුවකු බවත්, වෙනත් රටක පදිංචිකරුවකු නොවන බවත් ප්‍රකාශ කරමි.

ඉහත සඳහන් තොරතුරු මාගේ උපරිම දැනුම අනුව සත්‍ය බවට ගාම්භීරතා පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙසත් දිවුරා ප්‍රතිඥා දෙමි*/ දිවුරුම් දෙමි.

................................
ඉල්ලුම්කරුගේ අත්සන හෝ මාපටැඟිලි සළකුණ

දිනය :

මා ඉදිරිපිට දී............................ මස................ වන දින ප්‍රතිඥා දෙන ලදී*/ දිවුරුම් දෙන ලදී*.

...........................................
සාමදාන විනිශ්චයකාරවරයාගේ හෝ
දිවුරුම් කොමසාරිස්වරයාගේ අත්සන

සාමදාන විනිශ්චයකාරවරයාගේ හෝ දිවුරුම්
කොමසාරිස්වරයාගේ නම සහ ලිපිනය........................................................

දිනය :

*අදාළ නොවන කොටස් කපා හරින්න.

### විශේෂ ප්‍රකාශයේ ආකෘතිය

5. (අ) මම ඉන්දියාවේ පුරවැසිභාවය ස්වේච්ඡාවෙන් අත් කර ගෙන සිටි නමුත් 1964 ඔක්තෝබර් මස 30 වන දින සිට මම ශ්‍රී ලංකාවේ ස්ථිරව වාසය කරන සහ වාසය කර ඇති බවත්, වෙනත් රටක වාසය කර නොමැති බවත්, ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ස්වේච්ඡාවෙන්ම ලබා ගන්නා බවත්, දිගටම ශ්‍රී ලංකාවේ වාසය කරන බවත්, මෙයින් ප්‍රකාශ කරමි.

(ආ) ඉහත නම් සඳහන් මම*/මගේ ළමයා ශ්‍රී ලංකාවේ වාසය කරන බවත්, වෙනත් රටක වාසය නොකරන බවත් ප්‍රකාශ කරමි. මගේ උපරිම දැනුම අනුව ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවට ගාම්භීරතා පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙසත්, ප්‍රකාශ කර ප්‍රතිඥා දෙමි/දිවුරුම් දෙමි.

..............................................
ඉල්ලුම්කරුගේ අත්සන හෝ මාපටැඟිලි සළකුණ

දිනය :

---

*අදාළ නොවන කොටස් කපා හරින්න.

මා ඉදිරිපිට දී.................... මස ................වන දින ප්‍රතිඥා දෙන ලදී*/ දිවුරුම් දෙන ලදී.*

........................................
සාමදාන විනිශ්චයකාරවරයාගේ *හෝ
දිවුරුම් කොමසාරිස්වරයාගේ අත්සන

සාමදාන විනිශ්චයකාරවරයාගේ* හෝ දිවුරුම්
කොමසාරිස්වරයාගේ නම සහ ලිපිනය........................................................
දිනය :

*අදාළ නොවන කොටස් කපා හරින්න.

'ආ' උපලේඛනය

(4 වන වගන්තිය)

**2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත**

පුරවැසිභාවය පිළිබඳ සහතිකය

ඉහත කී පනතේ 4 වන වගන්තියේ විධිවිධාන මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉන්දියානු සම්භවය සහිත තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා වූ කොමසාරිස්වරයා වන.......................................................... මම ............................................................................පදිංචි
(ලිපිනය සඳහන් කරන්න)

..........................................................................යන අය 2 වන
(නම සඳහන් කරන්න)
වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවට මෙයින් සහතික කරමි.

පුරවැසියාට අදාළ තොරතුරු

නම :....................................................

පුරවැසියකු* /පුරවැසියන් වන දෙමාපියන්ගේ නම් :

1.............................................

2.............................................

උපන් දිනය සහ ස්ථානය :....................................................................

ස්ත්‍රී පුරුෂ භාවය:..............................................................

ජාතික හැඳුනුම්පත් අංකය (ඇත්නම්):...................................................

.............................................................
ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන් ලියාපදිංචි
කිරීම සඳහා වූ කොමසාරිස්.

දිනය:

*අදාළ නොවන කොටස් කපා හරින්න.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.